2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## ගල්වල -538 A



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 538 A -ගල්වල

## ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

චන්දන ද සිල්වා මහතා

# පටුන

පිටු අංක


1. පිහිටීම, සාමාජයීය හා සංස්කෘතික කරුණු හා මුලික තොරතුරු - 01

2. වසමේ සිතියම- 01

3. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම:- 02-04

4. නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම- 05-06

5. සමාජ සංවර්ධන සැලැස්ම:- **07-10**

6. සෞඛ්‍ය හා පෝෂණය :- **11**

7. විදුලිය හා ජල පහසුකම් සංවර්ධනය - **12**

8. ක්‍රීඩා හා විනෝදාස්වාදය- **13-14**

9. අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය:- **14**

10. ඉතා දිළිදු අය සඳහා වන සංවර්ධන සැලැස්ම:- **15**

11. පරිසර කලමණාකරන සැලැස්ම:- **16-18**

12. කෘෂිකර්ම සැලැස්ම:- **19-20**

## 01.පිහිටීම, සාමාජයීය හා සංස්කෘතික කරුණු හා මූලික තොරතුරු


ගල්වල වසම උතුරින් හත්බෝධිය වසමටත්, දකුණින් දෙහිවල නැගෙනහිර වසමටත්, නැගෙනහිරින් උද්‍යාන වසමටත්, බටහිරින් බටහිර දෙහිවල වසමටත් මායිම්ව පවතී. එහි විශාලත්වය හෙක්ටයාර 46 ක් (වර්ග කිලෝ මීටර් 0.460 වේ) ගල්වල යන නම ගල්වලක් නිසා ඇතිවූ බවට අනුමාන කල හැකිය. එම වසමේ ප්‍රධාන මාර්ගයක් වන ගල්වල පාරද එම නම ලැබීමට මූලිකවූ බවට අනුමාන කල හැක. ගල්වල ග්‍රාමය තුල සිංහල, මුස්ලිම්, දෙමල, බර්ගර් සහ මැලේ යන ජන කොටස් ප්‍රධාන වශයෙන් ජීවත් වේ. ආගම් වශයෙන් බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික (ක්‍රිස්තියානි) අයත් පිරිස ජීවත් වේ.

ගල්වල වසම පාසැල් 2ක්ද, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක්, මහ නගර සභාවක්, උප තැපැල් කාර්යාලයක්, ලමා හා මාතෘ සායනයක්, MOH කාර්යාලයක්, පොදු නාන ළිඳකින් සහ සුපිරි වෙළඳසැලකින්ද සමන්විත වේ.

මේ වසමේ පිහිටි ප්‍රධාන මාර්ග අතර ගාලුපාර, අනගාරික ධර්මපාල මාවත, ගල්විහාර පාර ප්‍රධාන වේ. මීට අමතරව පීරිස් පාර, ජය ශ්‍රී මාවත, තිස්ස මාවත, සිරිමල් මාවත, ප්‍රතිබිම්බාරාම පාර සහ රොබට් පාරද වේ. මෙම මාර්ග පළලින් අඩි 15 පමණ වේ.

මෙම ප්‍රදේශය අධි නාගරික ප්‍රදේශයක් වන බැවින් ග්‍රාමීය ප්‍රජාව අතර කිට්ටු සම්බන්ධකම් දක්නට නොලැබේ, දීර්ඝ කාලයක් පදිංචිව සිටින ගම්වාසීන් සුළුතරයක් සිටින අතර බහුතරය පිට පළාත්වල කොළඹ රැකියාවලට පැමිණ ගමනාගමන පහසුව සඳහා පදිංචි වූ පිරිස වේ. මොවුන් පුද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ රැකියාවල නිරතවන මධ්‍යම පාන්තික ජනගහනය වේ. දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින අඩු අදායම් ලබන ගම්වාසීන් තම ඉඩම් විකුණා පිට පලාත්වලට සංක්‍රමණය වීමක්ද දක්නට ඇත.

## 02.වසමේ සිතියම



වසමේ ඇති මාර්ග ගත් කල ඒවා බහුතරය කාපට් මාර්ග ලෙස සංවර්ධනය කොට ඇත. තාර දමා ඇති මාර්ග කිහිපයක් සංවර්ධනය කල යුතුව ඇත. ඒවා යේ නඩත්තු කටයුතු වරින් වර දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් සිදු කරනු ලබන අතර ප්‍රදේශයේ ජනජීවිතයට ගැටළුකාර තත්වයක්ව ඇත්තේ ජලය හරියාකාරව බැස නොයන අක්‍රමවත් අබලන් කාණු පද්ධතියයි. ගල්විහාර පාරේ අතුරු පාරක් වන අතපත්තු පාර හරහා ගමන් කරන ඇල මාර්ගය වැසි දිනවල පිටාර ගැලීම හේතුවෙන් ප්‍රදේශවාසීන්ගේ වතු නිවාස ජලයෙන් යටවීමෙන් ඔවුන් පීඩාවට පත් වෙයි. මෙයට සුදුසු දිගුකාලීන විසඳුමක් සපයා දිය යුතුව ඇත. කෙටි කාලීන විසඳුමක් ලෙස ඇල මාර්ගය ගැඹුරු කොට එයට ජලය යන කාණු පද්ධතිය පළල් කොට ඉදිකිරීම මගින් සපයා දිය හැක. දිගුකාලීන විසඳුමක් ලෙස අලුතින් භූගත කාණු ඉදිකිරීම. ඇල දෙපස පළල් කොට වැඩි වතුර ප්‍රමාණයක් එකවර බැහැර කල හැකි අයුරින් සකස් කිරීම දැක්විය හැක. මේ සඳහා අනවසර ඉදිකිරීම් ඉවත් කොට ඇල පටුවී ඇති ස්ථාන පළල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කල යුතුව ඇත.

මීට අමතරව ජය ශ්‍රී මාවතත් ජයසෙවන මාවතත් යා කරමින් තිස්ස මාවත අවසන් වන ස්ථානයේ පාලමක් ඉදි කිරීම මගින් ප්‍රදේශයේ ජනතාවට ප්‍රතිබිම්බාරාම පාර හා රෝහල පාර මැදින් රෝහල පාර වෙත පිවිසීමට විකල්ප මාර්ගයක් නිර්මාණය වේ. මීට අමතරව අතුරු පාරවල් කිහිපයක් සංවර්ධනය කල යුතුව ඇත. ඇතැම් අතුරු පාරවල් වල පළලින් වැඩි වාහන දෙකකට මාරුවීමට ඇති ඉඩකඩ සීමිත බැවින් දෙපස ඇති කාණු සඳහා ස්ලැබ් පියන් දමා සංවර්ධනය කල යුතුව ඇත. මීට අමතරව පන්සල් වල නඩත්තු කටයුතු අඛණ්ඩව කල යුතුව ඇත. පන්සල් වල ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ කටයුතු කිහිපයක්ද කල යුතුව ඇත.

අඩු ආදායම්ලාභී පවුල් 20ක් පමණ නන්දිමිත්‍ර පාරේ ආරම්භයේ සරණංකර පාරට යාබදව ජීවත්වේ. ඔවුන්ට මීන් ඉහතදී සිදුකල සංවර්ධන ව්‍යාපෘති මගින් නිවාසයේ වහලට කොන්ක්‍රීට් ස්ලැබ් දමා ස්ථිර වහලක් ලෙස සකස් කර දෙන ලදි. ඉහත ජීවත්වන පවුල් බහුතරය සතු සනීපාරක්ෂක පහසුකම් අවම මට්ටමක පවතී. ඔවුන් බහුතරයකට ඇත්තේ පොදු වැසිකිලියකි. ඇතැමුන් තාවකාලිකව අඩු පහසුකම් සහිත වැසිකිලි ඉදිකරගෙන ඇත. ඔවුනගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කල යුතුව ඇත.

මීට අමතරව අබලන් කාණු සංවර්ධනය කල යුතුව ඇත. ජලය නිසි පරිදි ගලා යෑමට අවහිර වී ඇති කාණු අලුත්වැඩියා කල යුතුව ඇත. මේ සඳහා ප්‍රදේශවාසීන්ගේ සහයෝගය ලබා ගැනීම පළමුව කල යුතුව ඇත. ප්‍රධාන මාවත් අතුරු මාර්ග අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය කිරිම කල යුතුව ඇත. සුදු ඉරි ඇඳීම, මාර්ග සංඥා යෙදීම, අවශ්‍ය ස්ථානවල පදික මාරුවීම් ඇති කිරීම කල යුතුය. ග්‍රාම නිලධාරී කාර්යාලයේ නවීකරණ කටයුතු සිදු කල යුතුව ඇත. මේ යටතේ විදුලි පංකාවක් සවි කිරීම, දිරා ඇති දොරවල් ඉවත් කොට අලුතින් දොරවල් සවිකිරීම. බිම ටයිල් කර බිත්ති වල තීන්ත ආලේප කිරීම මීන් සමහරකි.

පිංවත්ත පුරාණ විහාරයේ, ප්‍රතිබිම්බාරාම පන්සලේ, පුණ්‍යවර්ධනාරාම පන්සලේ මුස්ලිම් පල්ලියේ යටිතල පහසුකම් දියුණු කිරීම. එදිනෙදා අඛණ්ඩව කල යුතු නඩත්තු කටයුතු පවතී. උප තැපැල් කාර්යාලයේ, මෙතෝදිස්ත විදුහලේ නඩත්තු කටයුතු කල යුතුව ඇත. මුවර් පාරේ පිහිටි නාන ළිඳ ඉහතදී කරන ලද සංවර්ධන ව්‍යාපෘතියක් මගින් නවීකරණය කරන ලදි. පොදු නාන ලිද භාවිතා කරන පුද්ගලයින් හට ඇඳුම් මාරු කිරීමේ කාමර දෙකට සුදුසු පරිදි ආවරණයක් යෙදීම කල යුතුය.

විදුලිය සැපයිමේදි නියමිත වොල්ටීයතාව රදවා ගැනීමද කල යුතුය. ජල පීඩනය ඒකාකාරීව රදවා ගැනීමට කටයුතු කල යුතුය.

ටෙලිකොම් සමාගම මගින් අනාගත දත්ත සම්ප්‍රේෂණ වේගයන්ට ලගාවීම සඳහා Fiber optic රැහැන්වලින් සමන්විත තාක්ෂණයෙන් යුත් සම්ප්‍රේෂණ මාර්ග පද්ධතියක් ස්ථාපනය කල යුතුය.

<u>යටිතල පහසුකම් සඳහා වන සංවර්ධන සැලැස්ම:-</u>

<u>ගැටළුව:-</u>

මාර්ග අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැයවන කාලය හා ප්‍රමාදය වැඩිවීම, වර්ෂාකාලයේ මාර්ග ජලයෙන් යටවීම, සුළු ගංවතුර ඇතිවී නිවාස වලට හානි වීම.

<u>අරමුණු:-</u>

උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම, වර්ෂා කාලයේදී ජලය විධිමත්ව බැස යන ලෙස කාණු පද්ධති සැකසීම.

<u>උපායමාර්ග:-</u>

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණ නිලධාරී පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී මගින් අබලන් මාර්ග පරීක්ෂා කර ගැලපෙන ක්‍රමවේදයන් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි මාර්ග කාණු සංවර්ධනය කිරීම.

<u>ක්‍රියාකාරකම්:-</u>

<u>මාර්ග හා කාණු පද්ධති</u>

1. පුණ්‍යවර්ධනාරම විහාරස්ථානය මැදින් යන පොදු කාණුව රොබට් පාර දක්වා අළුතින් ඉදි කිරීම. (මෙම කාණුවේ ජලය ක්‍රමවත්ව ගලා යැමට සැලැස්වීම).
2. අතපත්තු පාරේ ඉතිරි කාණු සංවර්ධනය කිරීම. දිග අඩි 850 පළල අඩි 1 ½
3. රොබට් පාර නො: 03 සහ හිස් ඉඩම අතරින් දිවෙන කාණුව u හැඩයට කොන්ක්‍රීට් කිරීම.
4. සිරිමල් මාවත අංක 23/1සිට 27 දක්වා අලුතින් කාණු පද්ධතියක් ඉදි කිරීම. දිග අඩි 75 පළල අඩි 1 ½
5. සිරිමල් මාවත අංක 32 සිට ඉදිරියට කාපට් කිරීම. දිග අඩි 600 පළල අඩි 15
6. තිස්ස මාවත අංක 10 සිට ගල්විහාර පාර තෙක් ප්‍රධාන ඇලට ජලය බැස යන සේ සකස් කර සංවර්ධනය කිරීම. දිග අඩි 900 පළල අඩි 1 ½
7. ජය ශ්‍රී මාවතේ අංක 106 සිට රෝහල පාර දක්වා කාපට් කිරීම හා ඇල ඉවුර සංවර්ධනය කිරීම. දිග අඩි 2300 පළල අඩි 15
8. රොබට් පෙදෙස කාණු සංවර්ධනය කිරීම. දිග අඩි 175 පළල අඩි 1 ½

9. දෙහිවල අතපත්තු මාවතේ අංක 23/3 පිහිටි අතුරුපාර සංවර්ධනය කිරීම. දිග අඩි 145 පළල අඩි 12
10. ප්‍රතිබිම්බාරාම පාරේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය අසල කාණුව සංවර්ධනය කිරීම. දිග අඩි 200 පළල අඩි 1 ½
11. රොබට් පාර අංක 27/1 , 17/1 ,17/1 ඒ බැවුමේ පිහිටි නිවෙස් වල වැසි ජලය බැස යැවීමේ ක්‍රමයක් නොමැති බැවින් එම නිවාස වැසි දිනවල ජලයෙන් යටවේ. එයට සුදුසු වැසි ජලය බැස යැවීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීම.
12. ප්‍රතිබිම්බාරාම පාරේ අතුරු මාර්ගයක් වන අංක 54 සිට 54/5 දක්වා පාරේ ජලය බැසයාමේ ක්‍රමවේදයක් සකස් කර ඉතිරි කොටසට කුට්ටි ගල් ඇල්ලීම. දිග අඩි 200 පළල අඩි 15
13. අතපත්තු පෙදෙස දෙපස කාණු සංවර්ධනය කිරීම හා පාර කාපට් කිරීම දිග අඩි 235 පළල අඩි 12
14. පීරිස් පාර අංක 26 සිට ඉදිරියට (ජය ශ්‍රී මාවත දක්වා) කාපට් කිරීම. දිග අඩි 350 පළල අඩි 14

**<u>කාලය:-</u>** අවුරුදු 1යි

**<u>ඍජු ප්‍රතිලාභීන්:-</u>** ව්‍යාපෘතිය කරන මාර්ගයේ දෙපස පදිංචිකරුවන්.

**<u>වක්‍ර ප්‍රතිලාභීන්:-</u>** අදාල මාර්ගය භාවිතයට ගන්නා සියලු දෙනා.

**<u>වගකීම:-</u>**

ආර්ථික සංවර්ධන නිලධාරී, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය.

තාක්ෂණ නිලධාරී

## 04.නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම

විභාග කේන්ද්‍ර අධ්‍යාපන රටාව අනුව අ.පො.ස සා/පෙළ විභාගයෙන් හා අ.පො.ස උ/පෙළ විභාගයෙන් අධ්‍යාපනය අඩක් නිමකර තරුණ පිරිස් රැකියා අපෙක්ෂකයන් ලෙස සමාජ ගතවේ. කාන්තාවන් සඳහා කර්මාණ්ත ශාලා, ඇගළුම් කර්මාණ්ත ශාලා තිබුණද වෘත්තීය නිපුණත්වයක් නොමැති පිරිමින් බොහෝවිට තෝරාගන්නේ රියදුරු රැකියාවයි. එයින්ද අඩු වියදමකින්, පහසුවෙන්ම කල හැකි රැකියාව වන ත්‍රී වීල් රියදුරු රැකියාව වැඩි පිරිස තෝරා ගනියි. මෙම ජීවනෝපායට විශාල ලෙස ජනතාව නැඹුරුවීම හේතුකොට ගෙන ක්‍රමයෙන් ඔවුන් වයසට යන විට ඔවුන්ට ලැබෙන ව්‍යායාම අඩුවීම හේතුවෙන් බෝ නොවන රෝගවලට ගොදුරු වේ. විශේෂයෙන්ම හෘද රෝග, දියවැඩියාව මින් ප්‍රධාන වේ. මෙය විශාල සමාජ ප්‍රශ්ණයක් බවට මේ වනවිට පත්වෙමින් ඇත. මීට අමතරව මොවුන්ගේ රැකියාවේ ස්වභාවය අනුව මත්ද්‍රව්‍ය භාවිතයටද ගොදුරුවීමට ඇති ඉඩකඩද ඉතා වැඩිය. මෙයට ඇති හොඳම විසඳුමක් වන්නේ මෙම පාසැල් හැරයන පිරිස සමාජයේ ශ්‍රම බලකායට සෘජුව දායක වන පිරිසක් ලෙස නිපුණතා සංවර්ධනය කොට සමාජගත කිරීමයි. මොවුන්ගේ දැනුම හා කුසලතාවයන්ට වඩාත්ම ගැලපෙන්නේ වෘත්තීය පුහුණුවයි. ඒ සඳහා ඇති රැකියා අවස්ථාවන්ද පුළුල් වෙමින් පවතී. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ලංකා ජර්මන් කාර්මික විද්‍යාලය, NAITA ආයතනය, ලලිත් ඇතුලත්මුදලි පුහුණු ආයතනය, කාර්මික විද්‍යාලය මොවුන්ගේ දක්ෂතාවයන් හා සැසඳෙන විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පඨමාලා විශාල සංඛ්‍යාවක් මෙහෙයවනු ලබයි. එම පාඨමාලා බොහෝමයක් ඉතා සහනදායී ගාස්තු යටතේහැදෑරිය හැකිය. වෘත්තීය පුහුණුව ලබන්නන්ගේ වියදම් පියවා ගැනීමට බැකු ණය ලබාදීම මගින් ඔවුන්, පාඨමලා ගාස්තු කොටස් වශයෙන් අයකිරීම මගින් එවැනි පුහුණුවන් ලබාගැනීම සඳහා උනන්දු කරවිය හැක. මීට අමතරව ඉහල අධ්‍යාපනය නොලබා පාසැල් හැර යන සියල්ලන්ට පරිඝණක හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුහුණුව ලබා දීම මගින් ඔවුන්ට රැකියාවන් සඳහා නියුක්ත වීමට ඇති අවස්ථා පුළුල් කරගත හැක. මීට අමතරව දැනටමත් රැකියාවල නියුක්ත අය සඳහා සතිඅන්ත දිනයන්හි ඔවුන්ට ගැලපෙන පාඨමාලා පැවැත්වීම මගින් දැනටමත් රැකියාවල නියුක්ත වුවන්ගේ ඵලධායිතාව වැඩි කරගත හැක. පාඨමලා හදාරන කාලය තුල තම දෛනික වියදම් පියවා ගැනිමට විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට මෙන් රජයෙන් ගෙවීමක් කිරීමට ඇති හැකියාව විමසා බැලීමද වැදගත් වේ. පූර්ණ ශිෂ්‍යත්ව, අර්ධ ශිෂ්‍යත්ව පිරිනැමීම මගින් මුළු පාඨමලාවම හෝ ඉන් කෙටසක් සඳහා නොමිලේ පිරිනැමීමද සුදුසු වැඩපිළිවෙලකි. දක්ෂ ලෙස පාඨමලාව අවසන් කරන්නන් සඳහා රැකියාවන් සඳහා යොමුකිරිමද කල හැකිය. නූතන අවශ්‍යතාවන් හා සැසඳෙන ලෙස පාඨමාලා වරින්වර සංශෝධනය කල යුතුය. නූතන තාක්ෂණ ක්‍රමවේද භාවිතා කල යුතුය. තමාට වඩාත් ගැලපෙන පාඨමලාව තෝරා ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීමේ වැඩපිළිවෙලක් ආරම්භ කල යුතුය.

**<u>නිපුණතා සංවර්ධන සැලැස්ම:-</u>**

<u>ගැටළුව:-</u> පාසැල් අඩු අධ්‍යාපනය ලබා පාසැල් හැරයන තරුණ තරුණියන් තුල වෘත්තීය කුසලතා අවම මට්ටමක තිබිම.

<u>අරමුණු:-</u> පාසැල් හැරයන තරුණ තරුණියන්ගේ නිපුණතා මට්ටම ඉහල දැමීම.

<u>උපායමාර්ග:-</u> වෘත්තීය පුහුණුවක් නොමැති තරුණ තරුණියන්ට වෘත්තීය රැකියාශ්‍රිත පුහුණුවක් ලබාදීම.

**<u>ක්‍රියාකාරකම්:-</u>** VTC (වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට යොමු කල යුතු අය හඳුනා ගැනීම. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඔවුන්ට වඩාත් ගැලපෙන පාඨමාලා සඳහා යොමු කිරීම.)

**<u>කාලය:-</u>** මාස 3 සිට අවුරුදු 1 දක්වා

**<u>ඍජු ප්‍රතිලාභීන්:-</u>** පාඨමාලා හදාරන තරුණ තරුණියන්

**<u>වගකීම:-</u>** නිපුණතා සංවර්ධන නිලධාරී, විද්‍යා තාක්ෂණ නිලධාරී

**<u>ගැටළුව:-</u>** රැකියාලාභීන් සතු න්‍යාය හා ප්‍රායෝගික පුහුණුව අවම මට්ටමක තිබීම.



**<u>අරමුණු:-</u>** සම්ප්‍රදායික රැකියාවල යෙදී සිටින අයගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම.

**<u>උපායමාර්ග:-</u>** වෘත්තීමය නව තාක්ෂණ දැනුම වර්තමානයට ගැලපෙන ලෙස ලබාදීම.

**<u>ක්‍රියාකාරකම්:-</u>**

වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට යොමු කිරීම,
අදාල විෂය අංශ තොරා ගැනීමට මාර්ගෝපදේශකත්වය ලබා දීම.

**<u>කාලය:-</u>** මාස 3 සිට අවුරුදු 1 දක්වා

**<u>ඍජු ප්‍රතිලාභීන්:-</u>** පාඨමාලා හදාරන තරුණ තරුණියන්

**<u>වගකීම:-</u>** නිපුණතා සංවර්ධන නිලධාරී, විද්‍යා තාක්ෂණ නිලධාරී,

## 05.සමාජ සංවර්ධන සැලැස්ම:-

ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය (අවුරුදු 60 ඉක්මවු ජේෂ්ඨ පුරවැසියන්) සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී . මේ හේතුව නිසා වැඩිහිටියන් රැකබලාගැනීමේ ගැටළුවට පොදුවේ රටක් වශයෙන් ශ්‍රී ලංකාව මුහුණදී සිටියි. මෙයට අමතරව මෙම තත්වය වඩාත් සංකීර්ණ වී ඇත්තේ බොහෝමයක් වියපත්වූ වැඩිහිටින්ට තමන්ට වෙන්වූ ආදායම් මාර්ගයක් නොමැති වීමයි. ඇතැම් දෙමාපියන් රැක බලා ගැනීම දරුවන් විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවන්ද ඇත. මේ හේතු නිසා වැඩිහිටි නිවාස නේවාසික වැඩිහිටියන්ගෙන් පිරී පවතී. මේ අනුව ස්ථිර අදායමක් නොමැති වැඩිහිටියන් මේ වන විට ගැටළු රාශියකට මුහුණ දී සිටියි. මෙයට විසඳුමක් ලෙස රජය මෙන්ම පුද්ගලික ආයතන, ස්වේච්ඡා සංවිධාන වලටද සහනදායි මිලකට වැඩිහිටි සංවිධාන පවත්වා ගෙන යාමට අවසර දීම කල යුතුව ඇත. වැඩිහිටියන්ට සහනදායි මිලකට වෛද්‍ය පරික්ෂණ සිදු කර ගැනීමේ අවස්ථාවද සලසා දිය යුතුය. වියපත්වන හැම වැඩිහිටියෙකුටම විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුය.

ප්‍රදේශයේ ඇති පාසැල්වල මානව, භෞතික සම්පත් හිගකම දක්නට ලැබේ. පුස්තකාල, විද්‍යාගාර, ක්‍රීඩා පිටි, දක්ෂ ගුරුවරුන් නොමැතිකම බොහෝ පාසැල් මුහුණදී සිටින ගැටළුවකි. මෙම පාසැල් දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසිය යුතුය. මෙම පාසැල්වල සේවය කරන ගුරුවරුන්ට වැටුපට අමතරව යම් දීමනාවක් ගෙවීම මගින් මෙම පාසැල් වල ඇති ගුරු පුරප්පාඩු පිරවීමටත් දක්ෂ ගුරුවරුන් මේ පාසැල්වලට ආකර්ෂණය කර ගැනීමටත් අවස්ථාව සැලසේ. හැම පාලාතකම, දිස්ත්‍රික්කයකම ජාතික පාසැල් සංඛ්‍යාව වැඩි කර එම පාසැල් අංග සම්පූර්ණ පාසැල් ලෙස සංවර්ධනය කිරීම මගින් මෙම ගැටළුව යම්තාක් දුරකට මඟ හරවා ගත හැක.

දෙහිවල ගල්වල ග්‍රාමය ජනාකීර්ණ නගරයක පිහිටීම හේතුකොටගෙන අනවසර හා අවිධිමත් ඉදිකිරීම් ඉදිවීම නිසා එහි ප්‍රජාවට ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවී ඇත. මුවර් පාරේ සහ නන්දිමිත්‍ර පාරේ නාගරික පැල්පත් තුල ඉඩ අහුරා ඉදිකල නිවාස දක්නට ලැබේ. ඉඩකඩ ඉතා සීමිත වීම, සනීපාරක්ෂක පහසුකම් අවම මට්ටමක පැවතීම හේතුවෙන් සමාජීය ගැටළු ඇතිවේ. අවිධිමත් ඉදිකිරීම් හේතුවෙන් ඇතිවී තිබෙන සමාජීය, පාරිසරික ගැටළු අතර පවුල් අතර මතභේද ඇතිවීම. කානුවල ජලය නිසියාකාරව බැස නොයෑම, අපිරිසිදු පරිසරයක් නිර්මාණය වීම. කැලි කසල අක්‍රමවත්ව බැහැර කිරීම ප්‍රධාන වේ. මෙයට විසඳුමක් ලෙස අවිදිමත් ඉදිකිරීම්වලට විකල්පයක් ලෙස ඉඩම් නිවාස සැලසුමකට අනුව ඉදිකිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කල යුතුය.

නාගරික පැල්පත් ආශ්‍රිතවත්, ඉහල හා මධ්‍යම පාන්තික ප්‍රජාව අතරත් ඇති බරපතල ගැටළුවක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතයට තරුණ පිරිස් යොමුවීම දැකිය හැක. මෙයට වඩාත් නැඹුරුවීමට අවධානමක් ඇත්තේ පාසැල් අධ්‍යාපනය අතර මඟ නතර වූ තරුණ පිරිසය. මීට අමතරව අඩු අධ්‍යාපන මට්ටමක් සහිත තරුණ පිරිස්ද මීට වඩාත් යොමුවීම දැකිය හැක. සිගරට් සහ මද්‍යසාර භාවිතය කලක සිට ශ්‍රී ලංකා ප්‍රජාව අතර ප්‍රචලිත වී තිබුණද නුතනයේ ඒවාට අමතරව හෙරොයින්, ගංජා, අයිස්, කොකේන්, හශිස් වැනි භායානක ප්‍රතිඵල ගෙන දෙන මත්ද්‍රව්‍යද ප්‍රචලිත වී ඇත. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් තම ඉලක්කගත ගැනුම්කරුවන් වෙත ඉතා ශුක්ෂම අයුරින් තම නිෂ්පාදන භාවිතයට හුරු කිරීම කරගෙන යයි.

චිත්‍රපටි, ටෙලිනාට්‍ය වලට දායක වන අයවලුන් නළු නිලියන්, චිත්‍රපට අධ්‍යක්ෂවරුන්, දෙබස් රචකයන් තුලින් මේ සඳහා පුළුල් වක්‍ර ප්‍රචාරයක් ලබාදේ. මීට අමතරව ක්‍රීඩා තරග වලදී ද මොවුන්ගේ නිෂ්පාදනවල සමාජ වැදගත්කම හා පිළිගැනීම දක්වමින් වක්‍ර ප්‍රචාර ගෙන එයි. මෙම මත්ද්‍රව්‍ය භාවිතය පිටුදැකීමට වත්මන් රජය පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරයි. වසම් මට්ටමෙන් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු දැනටමත් ස්ථාපනය කොට ඇත. මෙමගින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ඔවුනගේ කැමැත්ත මත පුනරුත්ථාපනය කොට නැවත සමාජගත කිරීමට පියවර ගනු ලැබේ. අවධානම් පිරිස් හඳුනාගෙන ඔවුන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම වැලැක්වීමට පියවර ගනු ලැබේ. සිවිල් ආරක්ෂක කමිටු (සුරකිමු ලංකා), මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු මගින් වසමේ සිදුවන මත්ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් අදාල ආරක්ෂක අංශවලට ලබාදීම මගින් මත්ද්‍රව්‍ය පිටුදැකීමට කටයුතු කරනු ලැබේ.

**<u>සමාජ සංවර්ධන සැලැස්ම:-</u>**

**<u>ගැටළුව:-</u>** වැඩිහිටියන් සමාජයේ හුදකලාවීමෙන් පිඩාවට පත්වීම

**<u>අරමුණු:-</u>** වැඩිහිටි ප්‍රජාව සමාජයේ සක්‍රීය පිරිසක් බවට පත් කිරීම.

**<u>උපායමාර්ග:-</u>** වැඩිහිටි පිරිස සවිබලකරණය යටතේ සමාජයේ සක්‍රීය ලෙස දායක විය හැකි අයුරින් වැඩසටහන් සංවිධානය කිරීම.

**<u>ක්‍රියාකාරකම්:-</u>**

වැඩිහිටි සුහද හමු පැවැත්වීම

වැඩිහිටි සමිති සක්‍රීය කර යාවත්කාලීන කිරීම.

**<u>කාලය:-</u>** අවුරුදු 1

**<u>සෘජු ප්‍රතිලාභීන්:-</u>** වැඩිහිටි ප්‍රජාව

**<u>වක්‍ර ප්‍රතිලාභීන්:-</u>** වැඩිහිටි ප්‍රජාව ජීවත්වන පවුල් ඒකක.

**<u>වගකීම:-</u>** සමාජ සේවා නිලධාරී

**<u>ගැටළුව:-</u>** අවිධිමත් ඉදිකිරීම් නිසා සමාජ පාරිසරික ගැටළු ඇතිවීම

**<u>අරමුණු:-</u>** අවිධිමත් ඉදිකිරීම් අවම කිරීම

**<u>උපායමාර්ග:-</u>** වසම තුල අනවසර ඉදිකිරීම් සැලසුම් සහගතව ඉදිකිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

**<u>ක්‍රියාකාරකම්:-</u>** නිවාස සංවර්ධන අධිකාරිය, දෙහිවල ගල්කිස්ස නගර සභාව තාක්ෂණ නිලධාරීන් එක්ව අවිධිමත් ඉදිකිරීම් අවම කිරීමට කටයුතු කිරීම

**<u>කාලය:-</u>** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** අවිධිමත් ඉදිකිරීම් නිසා පීඩාවට පත්වන ජනතාව

**වගකීම:-** නිවාස සංවර්ධන අධිකාරිය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

**ගැටළුව:-** නාගරික බල ප්‍රදේශයන්හි දරුවන් වැඩිකොටසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම

**අරමුණු:-** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ සංඛ්‍යාව හා භාවිතය අවම කිරීම

**උපායමාර්ග:-** මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කිරීම.

**ක්‍රියාකාරකම්:-** මත්ද්‍රව්‍ය නිවාරණය වැඩසටහන් සංවිධානය කිරීම, දේශන සංවිධානය කිරීම, අත්පත්‍රිකා බෙදා හැරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම.

**කාලය:-** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්

**වක්‍ර ප්‍රතිලාභීන්:-** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ පවුල්වල සමාජිකයින්

**වගකීම:-**

අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ උපදේශන නිලධාරී, සමාජ සුභසාධන නිලධාරි, ළමා සංවර්ධන නිලධාරි.

**ගැටළුව:-** ප්‍රමිතියෙන් යුත් සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම.

**අරමුණු:-** විධිමත් සනීපාරක්ෂක පහසුකම් ඇතිකිරීම.

**උපායමාර්ග:-** සනීපාරක්ෂක පහසුකම් නොමැති හා අවිධිමත් ඉදිකිරීම් න්‍යාමනය කිරීම, වැසිකිළි ඉදිකිරීම් වලට නියමිත ප්‍රමිතිය ආරක්ෂා කිරීම.

**ක්‍රියාකාරකම්:-** අබලන් තත්වයේ ඇති වැසිකිළි අළුතින් ඉදිකිරීම.

අබලන් තත්වයේ ඇති වැසිකිළි නවීකරණය සඳහා මූල්‍ය හා ද්‍රව්‍ය ආධාර ලබාදීම.

ප්‍රමිතියෙන් යුත් සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.

පොදු වැසිකිළි නවීකරණය කිරීම.(නන්දිමිත්‍ර පාරේ අංක 18න් ආරම්භ වන නිවාසවලට පොදු)

අබාධිත අය සඳහා ඔවුනට ගැලපෙන සනීපාරක්ෂ පහසුකම් හා උපාංග ලබාදීම.

**කාලය:-** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** අළුතින් සනීපාරක්ෂක පහසුකම් හිමිවන ජනතාව**වගකීම:-**

මහජන සෞඛ්‍ය පරීක්ෂක, තාක්ෂණ නිලධාරී, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, සමාජ සේවා නිලධාරී.

## 06.සෞඛ්‍ය හා පෝෂණය:-

| | |
|---|---|
| **ගැටළුව:-** | පාසැල් ළමුන්ගේ, පෙර පාසැල් ලමුන්ගේ, ගර්භණී මව්වරුන්ගේ සහ අඩු බර ලමුන්ගේ<br><br>පෝෂණ වර්ධන සම්බන්ධ ඌනතා පැවතීම. |
| **අරමුණු:-** | බල ප්‍රදේශයේ පෝෂණ වර්ධන සම්බන්ධ ගැටළු අවම කිරීම හා සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහිකිරීම |
| **උපායමාර්ග:-** | පවුල් සෞඛ්‍ය නිලධාරීන් සමඟ වැඩසටහන් සංවිධානය කිරීම |
| **ක්‍රියාකාරකම්:-** | • පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• අඩු බර සහිත දරුවන්ට ත්‍රී පෝෂ ලබාදී එවැනි පෝෂ්‍යදායී අහාර හා ඒ පිළිබඳ දැනුම ලබා දීම.<br>• මාතෘ සායන සඳහා සහභාගී නොවන මව්වරුන් හා කුඩා ලමයින් ඒ සඳහා සහභාගී කරවීමට උනන්දු කරවීම. නිවැරදි හා පෝෂණ ගුණයෙන් යුතු ආහාර රටාවලට ලමයින් හුරු කරවීම. |
| **කාලය:-** | අවුරුදු 1 |
| **සෘජු ප්‍රතිලාභීන්:-** | මාතෘ සායනවලට සහභාගී වන මව්වරුන් සහ කුඩා දරුවන්. |
| **වගකීම:-** | මහජන සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය නිලධාරීන්, බටහිර සහ දේශීය වෛද්‍යවරුන්. |

.

## 07.විදුලිය සහ ජල පහසුකම් සංවර්ධනය කිරීම.

**ගැටළුව:-** අඩු වෝල්ටීයතාවක් සහිත විදුලි සැපයුමක් පැවතීම

**අරමුණු:-** විදුලි ධාරිතාවය ස්ථාවර කිරීම

**උපායමාර්ග:-** විදුලිය ඒකාකාරිව ලබා ගැනීමට විදුලිබල මණ්ඩලය සමග සැලැස්මක් සකස් කිරීම.

**ක්‍රියාකාරකම්:-** ට්‍රාන්ස්ෆෝමර් ස්ථානගත කිරීම, අධි වෝල්ටීය සම්ප්‍රේෂණ මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම.

**කාලය:-** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** ප්‍රදේශයේ ජීවත්වන ජනතාව.

**වක්‍ර ප්‍රතිලාභීන්:-** ප්‍රදේශයේ කර්මාන්තශාලාවල වැඩකරන සේවකයින්

**වගකීම:-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

**ගැටළුව:-** අඩු පීඩනයක් සහිත ජලය ලැබීම

**අරමුණු:-** ජල පීඩනය ස්ථාවර කිරීම (ඒකාකාරී සැපයුමක් ස්ථාපිත කිරීම)

**උපායමාර්ග:-** ජලය ඒකාකාරිව ලබා ගැනීමට ජල සම්පාදන මණ්ඩලය සමඟ එක්ව සැලැස්මක් සකස් කිරීම.

**ක්‍රියාකාරකම්:-** පැරණි ජලනල ඉවත්කර අලුත් ජලනල එලීම, මහල් නිවාස සඳහා ජලනල සම්බන්ධතාවයන් සුදුසු ප්‍රමිතියකට ලබාදීම.

**කාලය:-** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** ප්‍රදේශයේ ජීවත්වන ජනතාව.

**වක්‍ර ප්‍රතිලාභීන්:-** ප්‍රදේශයේ කර්මාන්තශාලාවල වැඩකරන සේවක පිරිස්.

**වගකීම:-**

ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව.

**ගැටළුව:-** පාසැල්වලට දරුවන් ඇතුලත් නොවීම.

**අරමුණු:-** වසමේ පාසැල් සඳහා දරුවන් ඇතුලත් වීමේ ප්‍රතිශතය වැඩිකිරීම

**උපායමාර්ග:-** පාසැල්වලට සම්බන්ධ පාර්ශවයන් එක්වී පාසැල් සංවර්ධන සැලැස්මක් සකස් කිරිම.

**ක්‍රියාකාරකම්:-** පාසැල් සතු භෞතික සම්පත් සංවර්ධනය කිරීම. ක්‍රීඩා පහසුකම්, විද්‍යාගාර දියුණු කිරීම, පුහුණු ගුරුවරු සංඛයාව වැඩි කිරීම. සනීපාරක්ෂක පහසුකම් වැඩි කිරීම, සුහුරු පන්තිකාමර ඇති කිරීම.

**කාලය:-** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** පාසැලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්.

වගකීම:-

කලාප අධ්‍යාපන කාර්යාලය, අධ්‍යාපන අමාත්‍යාංශය, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය.

## 08.ක්‍රීඩා හා විනෝදාස්වාද ක්‍රීයාකාරකම්

ගැටළුව:- පුද්ගලයින්ට ව්‍යායාම අඩුවීම හේතුවෙන් බෝ නොවන රෝගවලින් පෙලෙන ජනතාව වැඩිවීම.

අරමුණු:- ක්‍රීඩා කෞශල්‍යයන් දියුණු කිරීම, කායික හා මානසික සමබරතාවයෙන් යුත් පුරවැසියන්ගෙන් සමන්විත සමාජයක් ඇතිකිරීම.

උපායමාර්ග:- ක්‍රීඩා අමාත්‍යාංශය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ක්‍රීඩා අංශය සමඟ එක්වී වැඩසටහන් සංවිධානය කිරීම. ජාතික තරුණ සේවා සභාව සමඟ එක්වී වැඩසටහන් සංවිධානය කිරීම. තරුණ තරුණියන් ක්‍රීඩා සඳහා යොමු කිරීම. ක්‍රීඩා නිලධාරී සමඟ එක්වී වැඩ පිළිවෙලක් සකස් කිරීම.

**ක්‍රියාකාරකම්:-** ක්‍රීඩා කෞශල්‍යයන් ඇති අයවලුන් හඳුනා ගැනීම. ශරීර සුවතා මංතීරු ඇති කිරීම. අවම ඉඩකින් ස්ථාපිත කල හැකි ව්‍යායාම උපකරණ සවි කිරීම. අංග සම්පූර්ණ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම. ක්‍රීඩාවන් සඳහා ළමුන් යොමු කිරීම. ක්‍රීඩා උපදේශාත්මක සේවා සැපයීම. ළමා උද්‍යාන වැඩිදියුණු කිරීම. අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබාදීම.

**කාලය:-** අවුරුදු 1

**සෘජු ප්‍රතිලාභීන්:-** ක්‍රීඩා පහසුකම් ලබන වසමේ ක්‍රීඩාවට උනන්දුවක් දක්වන පිරිස.

වගකීම:-

තරුණ කටයුතු අමාත්‍යාංශය, ක්‍රීඩා අමාත්‍යාංශය, තරුණ සේවා සභාව.

ගැටළුව:- වාර්තා ගත නොවන ළමා අපයෝජන අවම කර ගැනීම.

අරමුණු:- ළමුන් ළමා හිංසනයෙන් මුදවා ගැනීම. ළමා හිංසනය මර්ධනය කිරීම.

උපායමාර්ග:- ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ හා ප්‍රජා නියෝජිතයන් සමඟ සැලැස්මක් සෑදීම. ක්‍රමවත් ළමා සංවර්ධන සැලැස්මක් සැකසීම.

**<u>ක්‍රියාකාරකම්:-</u>** අවධානම් සහිත ලමයින් හඳුනාගෙන ළමා හා පරිවාස නිලධාරීන් වෙත යොමු කිරීම. අවධානම් සහිත ලමයින් පිළිබඳ පසු විපරම් සිදු කිරීම. පාසැල් වල දරුවන් සඳහා උපදේශන සේවා ලබාදීම. කුට්ටනයට ලක්වූ දරුවන්ට මනෝ උපදේශන සේවා ලබා දීම.

**<u>කාලය:-</u>** අවුරුදු 1

**<u>සෘජු ප්‍රතිලාභීන්:-</u>** අවධානම් සහිත සහ කුට්ටනයට ලක්වූ දරුවන්.

**<u>වගකීම:-</u>** ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි,

## <u>09.අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය:-</u>

1. ප්‍රතිබිම්බාරාම විහාරස්ථානයේ පැරණි (සීමාමාලකය) වහලය ඇතුළු ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම හා බිමට ටයිල් ඇතිරීම.
2. පිංවත්ත පුරාණ විහාරයේ පුස්තකාලයට අවශ්‍ය පොත් ලබාදීම.
3. පිංවත්ත පුරාණ විහාරයේ සංඝාවාසය, ධර්ම ශාලාව, බෝධි ප්‍රාකාරය, පිරිවෙන් ශාලාව, දහම් පාසැල් ශාලාව, සංඝාර කුළුන, විනය කර්ම කරන පෝය ගෙයි සහ චෛත්‍යයේ නඩත්තු කටයුතු සිදු කිරීම.
4. පුණ්‍යවර්ධනාරාමයේ බුදු පුස්තකාලයක් හා කෞතුකාගාරයක් ඉදිකිරිම.
5. පුණ්‍යවර්ධනාරාමයේ බුදුගෙට දමා ඇති කොන්කීට් ස්ලැබ් එක උඩට කොන්ක්‍රීට් දමා කපරාදු කර වතුර කාන්දුව වැලැක්වීම.
6. ජුම්මා පල්ලියේ ගොඩනැගිලිවල නඩත්තු කටයුතු සිදු කිරීම.
7. ප්‍රතිබිම්බාරාම විහාරස්ථානයේ ශ්‍රී දැහැමි ගුණරත්න දහම් පාසැලට අවශ්‍ය ඩෙස් බංකු හා පුස්තකාලයට අවශ්‍ය වානේ කබඩ් ලබා දීම.
8. ප්‍රතිබිම්බාරාම විහාරස්ථානයේ දහම් පාසැල් පුස්තකාලය සංවර්ධනය කිරීම.
9. ග්‍රාම නිලධාරී කාර්යාලය අලුත්වැඩියා කිරීම.
10. ප්‍රතිබිම්බාරාම විහාරස්ථානයේ අළුත් ධර්මශාලාවේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම.
11. ප්‍රතිබිම්බාරාම විහාරස්ථානය සඳහා ශබ්ද විකාශණ යන්ත්‍ර කට්ටලයක් ලබා දීම.
12. පුණ්‍යවර්ධනාරාමයේ පිවිසුම් මාර්ගය වර්ෂාවකදී ජලයෙන් යට නොවන ලෙස සකස් කිරීම
13. පිංවත්ත පුරාණ විහාරයට අවශ්‍ය වයිට් බෝඩ් සහ මාකර් පෑන් ලබාදීම.

**<u>ජීවනෝපාය හා ව්‍යවසාය සංවර්ධන සැලැස්ම:-</u>**

**<u>ගැටළුව:-</u>** නිෂ්පාදන සඳහා වෙළඳපොල නාගරිකව අවමවීම.

**<u>අරමුණ:-</u>** පුළුල් නිෂ්පාදන වෙළඳපොලක් සැකසීම.

**උපායමාර්ග:-** තරගකාරී නිෂ්පාදන රටාවන් වෙළඳපොලට හඳුන්වා දීම. නිෂ්පාදන සඳහා සුදුසු වෙළඳපොලක් සැකසීම.

**ක්‍රියාකාරකම්:-** පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වා දීම. විදතා සංවර්ධන නිලධාරී සම්බන්ධ කර නිපුණතා පුහුණුව සහ තාක්ෂණික මෙවලම් හඳුන්වාදීම. ඇසුරුම්කරණය ලේබල්කරනය සම්බන්ධ දැනුම ලබාදීම. නිෂ්පාදන පිරිවැය අඩු කර විකුණුම් පිරිවැටුම වැඩි කරගත හැකි ක්‍රමඋපාය හඳුන්වා දීම.

**කාලය:-** අවුරුදු 1

**ඍජු ප්‍රතිලාභීන්:-** භාණ්ඩ නිෂ්පාදකයින් හා අලෙවිකරුවන්.

**වගකීම:-** විදතා සංවර්ධන නිලධාරී, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන නිලධාරී,

## 10.ඉතා දිළිඳු අය සඳහා වන සංවර්ධන සැලැස්ම:-

ගල්වල ඉතා දිළිඳු අයවලුන් ඉතා අඩු ප්‍රතිශතයක් 5% වඩා අඩු මට්ටමක පවතී. ඉතා දිළිඳු අයවලුන් වෙනුවට සිටින්නේ අඩු අදායම්ලාභීන්ය. මොවුන් බොහෝමයකට සමෘද්ධි ප්‍රතිලාභ හිමිවේ නැතහොත් සමෘද්ධි පොරොත්තු ලේඛනයේ සිටින්නන්ය. මොවුන්ට ලැබෙන අඩු ආදායම හේතුවෙන් ඔවුන්ගේ වාසස්ථාන අබලන් තත්වයක පවතී. සමහරෙකුට පෙර අවස්ථාවලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ හිමිව නොමැත. මොවුන්ට ප්‍රතිලාභවලට හිමිකම් කීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාගත නොහැක. (නිවාස ප්‍රතිලාභ පිරිනැමීමට සලකා බලන නිර්ණායකයන් බොහෝ අවස්ථාවලදී සංශෝධනය කල යුතුව ඇත) ඉඩමට ඔප්පු නොමැති වීම, විශ්‍රාම වැටුපකට හිමිකම් තිබීම, පවුලේ අයෙකුට රජයේ රැකියාවක් තිබීම, ඉඩමේ විශාලත්වය අවම ප්‍රමානයට අඩු වීම වැනි හේතු නිසා නිවාස ප්‍රතිලාභවලට හිමිකම් පෑමට අපොහොසත් වී ඇත. මෙයට අමතරව අඛණ්ඩ ජීවනොපායක් හිමිව නොතිබීම හේතුවෙන්ද ඔවුන්ගේ ආර්ථිකය මට්ටමක පිරිහීමට බලපා ඇත. වයසින් වැඩිවීම, රෝගවලින් පෙළීම නිසාද ජීවනොපාය දිගටම කර ගැනීමට නොහැකිවීම කෙරෙහි බලපා ඇත.

**කාන්තා සවිබල ගැන්වීම:-**

**වැන්දඹු පවුල් නගා සිටුවීම:-**

**ගැටළුව:-** ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නිසා ආර්ථික ගැටළු උත්සන්න වීම.

**අරමුණ:-** සෑමට ප්‍රමාණවත් ආදායමක් සැලසෙන ලෙස ඔවුන්ගේ ආදායම් ඉහල නැංවීම.

**උපායමාර්ග:-** ස්වයංරැකියා හඳුන්වා දී ඔවුන්ට ඒ සම්බන්ධයෙන් සවිබල ගැන්වීම. රාජ්‍ය නොවන ආයතන, පුද්ගලික ආයතන හා රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.

**ක්‍රියාකාරකම්:-** ස්වයංරැකියා ණය පහසුකම් සඳහා යොමු කිරීම. ස්වයංරැකියා සම්බන්ධ පුහුණුව ලබා දීම.පෞද්ගලික හා රාජ්‍ය අංශයේ රැකියාවන් සඳහා යොමු කිරීම, ස්වයංරැකියා සම්බන්ධ පුහුණුව ලබාදීම. වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම.

**කාලය:-** අවුරුදු 1

**ඍජු ප්‍රතිලාභීන්:-** අඩු ආදායම්ලාභීන් සහ ස්වයංරැකියාලාභින්.

**වගකීම:-** විදතා සංවර්ධන නිලධාරී. වනිතා සංවර්ධන නිලධාරී. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන නිලධාරී.

1. ස්වයංරැකියා වල නියුක්තවුවන්ට උපකරණ හා ණය ලබාදීම.

## 11.පරිසර කලමණාකරන සැලැස්ම:-

පරිසර කලමණාකරන සැලැස්ම යටතේ ගල්වල වසමේ ප්‍රධාන ගැටළුවක්ව පවතින්නේ වැසි දිනවල එකතුවන ජලය ක්‍රමවත්ව බැස යාමට යෝග්‍ය කාණු පද්ධතියක් නොතිබීමයි. මෙයට ප්‍රධාන වශයෙන් ගොදුරු වන්නේ අතපත්තු මාවත අවට ප්‍රදේශයයි. පාර දෙපස ඇති කාණු ඉදිකර ජලය ප්‍රධාන ඇල වෙත යොමු කෙරුවද ප්‍රධාන ඇලේ ජලය ක්‍රමවත්ව බැස නොයයි. ප්‍රධාන ඇලේ ජලය පිටාර ගැලීමක් සිදුවේ. මෙයට විසඳුමක් ලෙස ප්‍රධාන ඇල ගැඹුරු කිරීම හෝ පළල් කිරීම කල යුතුව ඇත. මෙයට අමතරව පිංවත්ත පන්සල අවට ප්‍රදේශය, ආතර්ස් පෙදෙසේ වම් පස කොටසද ජලයෙන් යටවේ, මේ සඳහා විසඳුමක් ලෙස ජලය ගලා යෑමට ඇති කානු ජලය ක්‍රමවත්ව ගලා බසින ලෙස සකස් කල යුතුව ඇත. පුණ්‍යවර්ධනාරාම පන්සල ඉදිරිපස මාර්ගයද ජලයෙන් යටවේ එහි කාණු ඉදිකර තිබුනද එවායේ ධාරිතාව ප්‍රමාණවත් නොවේ. පුණ්‍යවර්ධනාරාම පන්සල මැදින් ගලා බසින කාණුව රොබට් පාර දක්වා ඉදිකිරීමට යෝජිතය.

කසල බැහැර කිරීම ක්‍රමවත්ව සිදුකල යුතුය. අපද්‍රව්‍ය වර්ගීකරණය කොට කඩදාසි, වීදුරු, ඉදුල් (දිරන අපද්‍රව්‍ය) සහ ප්ලාස්ටික් ලෙස වර්ගකොට කසල රැගෙන යන අදාල දිනයන්හි කසල එකතු කරන නගර සභාවේ ට්‍රක්ටර්වලට ලබාදිම මගින් පරිසරය පිරිසිදුව තබා ගැනීමට ගමේ ප්‍රජාව දායක විය යුතුය. මෙයට අමතරව සෙවනත වැනි රාජ්‍ය නොවන සංවිධාන විසින් ප්‍රසිද්ධ ස්ථාන වල ස්ථාපිත කොට ඇති දැල් යොදා සැකසූ විශාල බහලුම් වලට ප්ලාස්ටික් බොතල් බැහැර කිරීම මගින් පරිසරය රැක ගැනීමට දායක විය යුතුය. දෙහිවල නගරයේ කසල ප්‍රතිචක්‍රීයකරන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරිම මගින් කසල නැවත ප්‍රයෝජනයට ගැනිම සිදු කිරීමට පුළුවන. මෙමගින් දිනපතා කරදියාන වැනි කසල බැහැර කරන ස්ථාන වලට ගොඩගැසෙන කසල ප්‍රමාණය සැහෙන ප්‍රමාණයකින් අඩු කර ගත හැක. මෙමගින් කුණු කඳු නායයෑම අවම කර ගත හැක.

අවිධිමත් ඉදිකිරීම් හා පරිසරය පිරිසිදුව තබා නොගැනීම හේතුවෙන් දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසම් 15 තුලම ඩෙංගු රෝගය උත්සන්න වීම සිදුවේ. ඩෙංගු රෝගය බෝවන ස්ථාන අතුරින් ප්‍රසිද්ධියක් උසුලන්නේ ඉදිකිරීම් කරන වැඩබිම්ය. මීට අමතරව ගෙවල්හිමියන් විසින් අත්හැර දමා ඇති වැසිකිලි, අබලන්වූ කාණු, ගොඩගසාගෙන ඇති ඉවත දමන දේ මෙම ඩෙංගු රෝගය ව්‍යාප්ත කරයි. මෙයට පිළියමක් ලෙස වැඩබිම් සඳහා දැන්වූ විට රසායන ද්‍රව්‍ය (Bate) ඉසීම සිදු කරයි. ඩෙංගු රෝගියකු හඳුනා ගත් විගස මදුරු ඝණත්වය අඩු කිරීම සඳහා දුම්මායනය කිරීම සිදු කරයි. මෙයින් මනුෂ්‍යයාට හිතකර කුඩා කෘමීන්ද විනාශ වීම කණගාටුදායක තත්වයකි. මීට

අමතරව ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී විසින් වසම් මට්ටමෙන් ඩෙංගු ශ්‍රමදාන සංවිධානය කරනු ලබයි. ආර්ථික සංවර්ධන නිලධාරීන් ආගමික ස්ථානවල

ශ්‍රමදාන මගින් ශුද්ධ කිරීමේ වැඩසටහන් සති අග සංවිධානය කරයි.

## <u>පරිසර කලමණාකරන සැලැස්ම:-</u>

| | | |
|---|---|---|
| **01** | **ගැටළුව:-** | අවිධිමත්ව කැලි කසල බැහැර කිරීම. |
| | **අරමුණු:-** | අපද්‍රව්‍ය සහ කැලි කසල කලමණාකරනය |
| | **උපායමාර්ග:-** | පරිසර හිතකාමී කැලිකසල බැහැරකිරීමේ සැලැස්මක් සකස් කිරීම. නගර සභාව සමඟ එක්ව කැලිකසල බැහැරකිරීමේ ක්‍රමවත් සැලැස්මක් සකස් කිරීම. |
| | **ක්‍රියාකාරකම්:-** | නැවත පරිහරණය කල හැකි අපද්‍රව්‍ය මිලදී ගන්නා පුද්ගලයින් සම්බන්ධිකරණය කිරීම. කසල ප්‍රතිචක්‍රීකරණය කල හැකි උපකරණ ලබාදීම. කසල බැහැර කිරීමේ බදුන් ප්‍රසිද්ධ ස්ථාන වල ස්ථානගත කිරීම |
| | **කාලය:-** | අවුරුදු 1 |
| | **ඍජු ප්‍රතිලාභීන්:-** | වසමේ ජීවත්වන පවුල්. |
| | **වක්‍ර ප්‍රතිලාභීන්:-** | අවශ්‍යතාවන් සඳහා පිටතින් වසමට පැමිණෙන ජනතාව. |
| | **වගකීම:-** | පරිසර නිලධාරි, මහජන සෞඛ්‍ය නිලධාරි, ප්‍රජා සංවර්ධන නිලධාරි, නගර සභාව, ප්‍රජා පොලිස් ඒකකය |
| **2** | **ගැටළුව:-** | ඩෙංගු උවදුර උත්සන්න වීම. |
| | **අරමුණු:-** | ඩෙංගු ව්‍යාප්තිය පාලනය කර ගැනීම. |
| | **උපායමාර්ග:-** | මහජන සෞඛ්‍ය කාර්යාලයෙන් මීට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්ධන බලකාය, මධ්‍යම රජය සහ පළාත් සභාව සමඟ එක්ව වැඩපිළිවෙලක් සකස් කිරීම. |
| | **ක්‍රියාකාරකම්:-** | අත්පත්‍රිකා, දැනුවත් කිරීමේ වැඩසටහන්, පිරිසිදු කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම . නිවාස පරික්ෂාව, පොදු ස්ථාන පිරිසිදු කිරීම. දුම්මායනය කිරීම, කාණු පිරිසිදු කිරීම. |

| | | |
|---|---|---|
| | **කාලය:-** | අවුරුදු 1 |
| | **සෘජු ප්‍රතිලාභීන්:-** | වසමේ ජීවත්වන පවුල්. |
| | **වගකීම:-** | පරිසර නිලධාරි, මහජන සෞඛ්‍ය නිලධාරි, |
| **3** | **ගැටළුව:-** | වර්ෂා කාලයේදී සුලු ගංවතුර තත්වයන් ඇතිවීම. |
| | **අරමුණු:-** | නිවාස දේපලවලට සිදුවන හානි අවම කර ගැනීම. |
| | **උපායමාර්ග:-** | වැසි ජලය නිසි පරිදි බැස යන ක්‍රමවේදයක් සැකසීම. ජලය බැසයන කාණු මත ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම |
| | **ක්‍රියාකාරකම්:-** | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට ඇති හැකියාව . කාණු ශුද්ධ පවිත්‍ර කිරීම. අබලන් වි ඇති කාණු සංවර්ධනය කිරීම. |
| | **කාලය:** | අවුරුදු 1 |
| | **සෘජු ප්‍රතිලාභීන්:-** | වසමේ ජීවත්වන පවුල්. |
| | **වගකීම:-** | පරිසර නිලධාරි, ආපදා කලමණාකරන නිලධාරි, නගර සභාව, සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරි |

## 12.කෘෂිකර්ම සැලැස්ම:-

ගල්වල වසමේ බොහෝමයක් ප්‍රදේශවාසීන් සතු ඉඩමේ ඉඩකඩ සීමිතය. එබැවින් දිරන කසල බැහැර කිරීම සඳහා කොම්පෝස්ට් බඳුන් ලබාදීම හෝ දිරන අපද්‍රව්‍ය කොම්පෝස්ට් බඳුන් බවට හැරවිය හැකි විදුලියෙන් ක්‍රියා කරන යන්ත්‍ර ලබාදීම යෝග්‍ය. මෙම පොහොර ප්‍රයෝජනයට ගෙන එළවළු, මිරිස් පැල වගා කර ගත හැකිය. පිසිමේදි භාවිතා කරන කුඩා පැලැටි වර්ග (herbs) බේ කොල, රෝස්මරි, මින්චි, කොත්තමල්ලි, පාස්ලි කොල තම නිවසේම කාබනික පොහොර යොදා වගා කර පිසීමේදී ප්‍රයෝජනයට ගත හැක. වගාකරුවන්ට අවශ්‍ය බීජ පැලැටි ලබාදීම මගින් ප්‍රදේශවාසීන්ට ගෙවතුවල වගා කිරීමට උනන්දු කල හැක. වගා ක්‍රම, වගාවන් සඳහා වැළදෙන (දිලීරවලින් සහ කෘමීන්ගෙන්) රෝගවලට කල හැකි පිලියම් පිලිබඳ අත් පත්‍රිකාවක් මගින් හෝ වාචිකව දැනුම ලබාදිය හැක. වගාවන් සඳහා අවශ්‍ය බීජ සහ පැල රත්මලානේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිහිටි අලෙවිසැලින් ලබා දිය හැක.

### කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම:-

| | |
|---|---|
| ගැටළුව:- | ගෙවතු වගාව සඳහා බිජ වර්ග නොමැති වීම. ගෙවතු වගාව ගැන ජනතාවගේ දැනුම අවම විම. වගාව සඳහා ඇති ඉඩකඩ අවම වීම |
| අරමුණු:- | නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම |
| උපායමාර්ග:- | අවම ඉඩකින් වැඩි ඵලධායිතාවක් සහිත වගා ක්‍රම සහ බීජ වර්ග ප්‍රජාවට හඳුන්වා දීම. වගා දැනුම ඇති කෘෂි නිලධාරීන් සහ ආයතන සම්බන්ධිකරණය කිරීම |
| ක්‍රියාකාරකම්:- | • වැඩි ඵලදායිතාවක් සහිත බීජ සහ පැල හඳුන්වා දීම. කෘෂි ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, තිරස් වගාව ප්‍රජාවට හඳුන්වා දීම. වගාවන්ට වැලදෙන රෝග නිවාරණ උපක්‍රම, පොහොර භාවිතය සම්බන්ධ උපදෙස් ලබාදීම. වගා නඩත්තු ක්‍රම හඳුන්වා දීම.<br>• ගෙවතු වගාව ඇත්තේ සීමිත ඉඩකඩක බැවින් බඳුන් වල එලවළු අනෙකුත් පැල වගා කිරීම සඳහා අවශ්‍ය බීජ සහ පැල ලබාදීම. |
| කාලය:- | අවුරුදු 1 |
| සෘජු ප්‍රතිලාභීන්:- | වසමේ වගාවන්ට සම්බන්ධවන පවුල් |

| | |
|---|---|
| **වක්‍ර ප්‍රතිලාභීන්:-** | වසමේ වගාවන්ට සේවා සපයන පුද්ගලයින් සහ ආයතන |
| **වගකීම:-** | කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි, කෘෂිකර්ම නිලධාරි, ගොවිජන සේවා නිලධාරි |